සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

11 ශ්‍රේණිය **84 - ශිල්ප කලා - I (නව නිර්දේශය)** කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය සපයා ඇති පිළිතුරු පත්‍රයේ කතිරයකින් සටහන් කරන්න.

---

01.
ඉන්නෙත් දුම්බර මහ කළු ගලක් — යට
කන්නෙත් කරවලයි රට හාලේ — බතට
බොන්නෙත් බොර දියයි පූරුවේ කළ — පවට
යන්නේ කවදා ද මව් පියෝ — දකින්නට

මෙය ජනකලාවට අයත් ජන කවියකි. මෙය කුමන ප්‍රභේදයකට අයත් ජන කවියක් ද?


(1) දෘශ්‍ය කලාවට ය. (2) ශ්‍රව්‍ය කලාවට ය. (3) ශ්‍රව්‍ය දෘෂ්‍ය කලාවට ය. (4) දෘශ්‍ය ජන කලාවට ය.

02. මෙම රේඛා වර්ගය ඡේදනය වන ස්ථානය දැක්වීම සඳහා භාවිතා කරයි. මෙය හඳුන්වන නාමය වන්නේ,




(1) ඝන අඛණ්ඩ රේඛා ය. (2) කඩ රේඛා ය.
(3) සිහින් දම රේඛා ය. (4) නිදහස් අතින් ඇඳින රේඛා ය.

03. සම්මුඛ පාද දෙකක් පමණක් සමාන්තරව පිහිටා, පාද දිගින් අසමාන බව නිරූපණය කරන රූප සටහන තෝරන්න.




(1) (2) (3) (4)

04. මෙම රූප සටහනින් දැක්වෙන්නේ කිනම් නිර්මාණයක් ද?




(1) බහුඅස්‍ර ඇඳීමේ පොදු ක්‍රමයයි.
(2) පාදයක දිග දී තිබෙන විට බහු අස්‍ර නිර්මාණය කිරීම යි.
(3) වෘත්තයක් තුළ සවිධි බහු අස්‍ර නිර්මාණය කිරීම යි.
(4) වෘත්තයක් තුළ බහු අස්‍ර නිර්මාණය කිරීමේ විශේෂ ක්‍රමයයි.

05. පහත දැක්වෙන්නේ බහු අස්‍ර නිර්මාණයකි. ඒ සඳහා භාවිතා කර ඇති බහු අස්‍ර මොනවා ද?



(1) චතුරස්‍ර හා ත්‍රිකෝණය.
(2) පංචාස්‍රය හා සප්තාශ්‍රය.
(3) පංචාස්‍රය හා ෂඩාශ්‍රය.
(4) ෂඩාශ්‍රය හා ත්‍රිකෝණය.


06. පහත දැක්වෙන්නේ කුමන වස්තුවක විකසන නිර්මාණයක් ද?



(1) චතුරස්‍රයක විකසනයයි.
(2) කේතුවක විකසනයයි.
(3) ඉලිප්සයක විකසනයයි.
(4) සිලින්ඩරයක විකසනයයි.

07. මහා අක්ෂය හා සුළු අක්ෂය, නාභිය යන කොටස් දැකිය හැක්කේ කුමන ජ්‍යාමිතික නිර්මාණයක ද?
(1) කේතුවක විකසන නිර්මාණවලදී ය. (2) ඉලිප්ස නිර්මාණවලදී ය.
(3) සිලින්ඩරයක විකසනය නිර්මාණවලදී ය. (4) ප්‍රිස්මයක විකසනය නිර්මාණවලදී ය.

08. මෙම රූප සටහන කුමන ජ්‍යාමිතික වස්තුවකට අයත්වේ ද?



(1) ගෝලයකි. (2) පිරමීඩයකි.
(3) ප්‍රිස්මයකි. (4) කේතුවකි.

09. යම් වර්ණ ප්‍රභේදයකට සුදු හෝ කළු පැහැය එක් කිරීම තුළින් පැහැය වෙනස් වේ. මෙම වර්ණ ප්‍රභේදය හඳුන්වනු ලබන්නේ,
(1) ද්විතීක වර්ණ ලෙසය. (2) තෘතික වර්ණ ලෙසය.
(3) මොනොක්‍රෝම් වර්ණ ලෙසය. (4) මූලික වර්ණ ලෙසය.

10. රෙදි පිළි පසු පිරියම් කිරීමේදී මහා පරිමාණ කර්මාන්ත ශාලාවල භාවිතා කරණ පසු පිරියම් ක්‍රමය වන්නේ,
(1) තද උෂ්ණත්වයෙන් මැදීම ය. (2) තද උෂ්ණත්වයේ සේදීම ය.
(3) උණුසුම් ජලයේ සේදීම ය. (4) රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් සේදීම ය.

11. වෙළෙඳපොළෙන් මිල දී ගන්නා ස්ටිකර්වලට සමාන කඩදාසි භාවිතා කරණ රෙදි පිළි අලංකරණ ක්‍රමයක් වන්නේ,
(1) ඇප්ලික් ක්‍රමය (2) අච්චු මුද්‍රණ ක්‍රමය (3) තිර රාමු මුද්‍රණ ක්‍රමය (4) තාප බන්ධිත ක්‍රමය


12. තිර රාමු මුද්‍රණයේ දී රෙදි පිළි සඳහා බහුලව භාවිතා කරනු ලබන සායම් වර්ගය වන්නේ,
(1) පිග්මන්ට් සායම් ය. (2) සරල සායම් ය. (3) සංකීර්ණ සායම් ය. (4) ප්‍රතික්‍රියාකාරී සායම් ය.

13. බතික් කලාව පිළි අලංකරණයේ වැදගත් කලාවකි. බතික් කලාව ආරම්භක රටවල් වන්නේ,
(1) ඉන්දුනීසියාව, මලයාසියාව, බැබිලෝනියාවය.
(2) ජපානය, චීනය, ජාවාය.
(3) මලයාව, ජපානය, චීනය.
(4) ඉන්දුනීසියාව, ජපානය, චීනය.

14. රෙදි පිළි අලංකරණයේ දී නිරායාසයෙන්ම ලැබෙන වර්ණ සංකලන සහිත ව සංකීර්ණව විහිදෙන සියුම් රේඛාවලින් යුත් මෝස්තර දැකිය හැක්කේ කුමන අලංකරණයේදී ද?
(1) ගැට පඬු ක්‍රමයේදී ය. (2) බතික් ක්‍රමයේදී ය.
(3) අච්චු ක්‍රමයේදී ය. (4) ස්ටෙන්සිල් ක්‍රමයේදී ය.

15. සෑම ශාකයකම අඩංගු මූලද්‍රව්‍ය කාබන්, හයිඩ්‍රජන්, ඔක්සිජන් සංයෝගයකින් සැදුණු අනුදාමයකින් යුත් කෙඳි වර්ගය හඳුන්වන්නේ,
(1) සෙලියුලෝස් කෙඳි ලෙසය. (2) ප්‍රෝටීන් කෙඳි ලෙසය.
(3) ඛනිජමය කෙඳි ලෙසය. (4) රසායනික කෙඳි ලෙසය.

16. අන්වීක්ෂීය පරීක්ෂාවේ දී සාමාන්‍ය කපු කෙන්දක හරස්කඩ පෙනුම නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,




(1) (2) (3) (4)

17. නූල් අංකනය කිරීමේදී බර රාත්තල්වලින් ද, දිග යාරවලින් ද දැක්වෙන්නේ නූල් අංකනය කිරීමේ කුමන ක්‍රමයක ද?
(1) මෙට්‍රික් ක්‍රමය (2) ටෙක්ස් ක්‍රමය (3) ඩේනියර් ක්‍රමය (4) ඉංග්‍රීසි ක්‍රමය

18. අංක $10^{s}$ තනිපට නූලත් දෙපට අඹරාගත් විට එහි අංකය $2/20^{s}$ වේ. ඒ අනුව කිලෝග්‍රෑම් ට අල්ලන නූල් කැරලි ගණන කීයද?

(1) 05 කි. (2) 10 කි. (3) 15 කි. (4) 20 කි.



19. රූපයෙන් පෙන්නුම් කරන්නේ,

(1) තනි පොට නූල් ය. (2) දෙපොට නූල් ය.

(3) තුන්පොට නූල් ය. (4) වැඩිපොට නූල් ය.

20. විවීමේ යන්ත්‍ර වර්ග හඳුනා ගැනීමේදී ඉතා පැරණි විවීමේ ක්‍රමයක් ලෙස සැලකෙන්නේ,


(1) මහන යන්ත්‍රයෙන් මැෂිම ය. (2) යුටිලිටි යන්ත්‍රයෙන් විවීම ය.

(3) මේස යන්ත්‍රයෙන් විවීම ය. (4) හැඩපෙති ආධාරයෙන් විවීම ය.


21. අත් යන්ත්‍රවල පොරෝදු රාමුව තුළ කම්බි ආධාරයෙන් පෝඩු වශයෙන් රඳවාගනු ලබන්නේ මොනවා ද?

(1) හරස් පොලු ය. (2) පා පොලු ය. (3) ලීවර ය. (4) අළුව ය.


22. පහත දක්වෙන්නේ හීරි වියමන්වල නූල් ඇඳීමේ ක්‍රම කිහිපයකි. එයින් කඩ හීරි රටාවේ නූල් ඇඳීමේ ක්‍රමය වන්නේ,




(1)



(2)



(3)



(4)

23. තුන්පට පිරවිලි කීපයක් එක් හිඩසට ගොතාගෙන එම ගෙතුම් එක පොකුරකට සම්බන්ධ කර ගෙතීම හඳුන්වන්නේ,

(1) කකුළු ගෙතුම ලෙසය. (2) පොප් කෝන් ගෙතුම ලෙසය.

(3) තුන්පට පිරවිලි ගෙතුම ලෙසය. (4) පත්තෑයා ගෙතුම ලෙසය.

24. භූගත සම්පතක් ලෙස සලකන මැටි හෙවත් ''ඇලුමිනා සිලිකේට්'' භාවිත කර භාණ්ඩ ඇතුළු විවිධ දේ නිපදවා ගැනේ. මැටි අණුවක අන්තර් ගත සංයෝගය වන්නේ,

(1) පෙල්ඩ්ස්පාර්, සිලිකා සහ ඩොලමයිට්ය.

(2) ඇලුමිනියම් ඔක්සයිඩ්, සිලිකන්ඩයොක්සයිඩ් සහ ජලය.

(3) පොටෑසියම්, ටයිටේනියම් ඔක්සයිඩ් සහ කැල්සියම්ය.

(4) සිලිකන්ඩයොක්සයිඩ්, ඇලුමිනියම් ඔක්සයිඩ් සහ ජලය.

25. ප්‍රාථමික මැටි, පිහිටි මැටි යන නම්වලින් මැටි විශේෂයේ භෞතික ලක්ෂණ වන්නේ,

(1) පැහැයෙන් සුදු වීමත් සුවිකාර්ය ගුණය අධික වීමත්ය.

(2) රතු දුඹුරු පැහැයෙන් සවිවරතා ගුණය අධික වීමත්ය.

(3) කළු දුඹුරු පැහැවීමත් නම්‍යශීලී ගුණය වැඩිවීමත්ය.

(4) පැහැයෙන් සුදු වීමත් සුවිකාර්ය ගුණය අඩුවීමත්ය.

26. සවිවරතා ගුණය අඩුවැඩිවීම සඳහා බලපාන සාධකය වන්නේ මැටි අංශුවක ඇති, අංශුමය පරිමාව අඩුවැඩි වීමය. සවිවරතා ගුණය අත්‍යවශ්‍ය ලෙස සලකා නිපදවිය යුතු මැටි භාණ්ඩ ලෙස සලකනු ලබන්නේ,

(1) උළු සහ බිම් ගඩොල් ය. (2) පිඟන් සහ පීරිසි කෝප්පය.

(3) සනීපාරක්ෂක භාණ්ඩය. (4) ගුරුලේන්තු සහ කළගෙඩිය.

27. මැටි ප්‍රවාහනයේදී ඉහළ යකඩ ප්‍රතිශතයක් එකතුවන මැටි රතු මැටි ලෙස හැඳින්වේ. එම මැටි භාවිත කර නිපදවන භාණ්ඩ කාණ්ඩය වන්නේ,

(1) පිඟන් පීරිසි වැනි පෝසිලේන් භාණ්ඩ.

(2) වළං, හට්ටි, මුට්ටි වැනි මුළුතැන්ගෙයි භාණ්ඩ.

(3) සෝදන බේසම්, නාන ටැංකි වැනි සනීපාරක්ෂක භාණ්ඩ.

(4) උළු, ගඩොල් වැනි ගොඩනැගිලි ඉදිකිරීම් ආශ්‍රිත භාණ්ඩ.

28. මහා පරිමාණ කම්හල්වල මැටි භාණ්ඩ පිළිස්සීම සඳහා භාවිත කරන පෝරණු වර්ග ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) උඩු දහණ පෝරණුව සහ යටි දහණ පෝරණුව (2) ආවරක පෝරණුව සහ දෝනා පෝරණුව

(3) දෝනා පෝරණුව සහ රෝලර් පෝරණුව (4) දේශීය පෝරණුව සහ ආවරක පෝරණුව

29. මැටි භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේදී ඉතා ඉහළ අලංකරණ ක්‍රමයක් ලෙස සිදුරු කැටයම් කැපීම සඳහා සුදුසු අවස්ථාව වන්නේ,

(1) නිෂ්පාදන අවස්ථාව (2) වියළි අවස්ථාව
(3) පිළිස්සීමෙන් පසු අවස්ථාව (4) හම් පදම් අවස්ථාව

30. මැටි බඳුන් අලංකාර කර ගැනීමේ ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| A | කොලාජ් නිර්මාණ | B | ඩෙකෝපාජ් නිර්මාණ |
| C | පල්ප නිර්මාණ | D | මාබල් නිර්මාණ |

ඉහත සඳහන් ක්‍රම අතුරින් කඩදාසි උපයෝගී කරගනු ලබන්නේ කුමන නිර්මාණ සඳහා ද?

(1) A සහ B (2) A සහ D (3) AB සහ C (4) AB සහ D

31. මැටි භාණ්ඩ දිස්න ගැන්වීමේ ක්‍රියාවලියේදී මුල් දේහයේ වර්ණය භාණ්ඩයට යොදන දිස්නය හරහා දිස්වන්නේ නම් ඒ කුමන දිස්න යෙදීමද?

(1) විනිවිද පෙනෙන දිස්න (2) විනිවිද නොපෙනෙන දිස්න
(3) නොදිලි දිස්න (4) ස්පටික රූපී දිස්න

32. මල් සැකසුම් සකස් කිරීමේදී නිර්මාණ කරුවන් විසින් විශේෂිත හැඩ කිහිපයක් මල් කළඹ සඳහා යොදා ගැනේ. මෙහිදී උඩරට මනාලියකට සුදුසු මල් කළඹවල හැඩය වන්නේ,

(1) දිගටි හැඩය, හදවත් හැඩය (2) ආමස්ට්‍රේ හැඩය, අයිඩ්‍රොප හැඩය
(3) පෝසි හැඩය, අශ්වලාඩමක හැඩය (4) දිගටි හැඩය, අයිඩ්‍රොප හැඩය

33. කඩදාසි මාල සෑදීමේදී කඩදාසි පබළු, ශක්තිමත් බව සහ කල් පැවැත්මද දිලිසෙන ස්වභාවය ඇති කර ගැනීමට ද යොදා ගන්නා ආලේපය හඳුන්වන්නේ,

(1) ලැකර් තීන්ත ආලේපය (2) වාර්නිෂ් ආලේපය
(3) පැබ්රික් තීන්ත ආලේපය (4) ඉමල්ෂන් තීන්ත ආලේපය

34. මොඩ්ලින් ක්ලේ (පදම් කරන ලද මැටි) වලින් ආභරණ සැකසීමේදී නම්‍යශීලී තත්වයට පත් කර ගැනීමට යොදා ගන්නා අනෙකුත් ද්‍රව්‍ය වන්නේ,

(1) බයින්ඩර් ගම් (2) පාන් පිටි පාප්ප (3) පොල්තෙල් (4) කපුරු කුඩු

35. 'ටෙඩි බෙයාර්' යන නාමය සැහැල්ලු සෙල්ලම් සතුන්ට ලැබුනේ තියෙඩෝර් රූස් වෙල්ට් ටෙඩීට නම් ජනපතිවරයෙකුගේ නමින් කොටසකිනි. එම ජනාධිපතිවරයා කුමන රටකද?

(1) එංගලන්තයේ ය. (2) ඇමරිකාවේ ය. (3) පකිස්ථානයේ ය. (4) පැරීසියේ ය.

36. ටෙඩි බෙයාර් නිෂ්පාදනයේ දී සැහැල්ලු බව සඳහා පිරවීමට පැඩිං යොදා ගනී. මේ සඳහා යොදා ගන්නා හොඳම පැඩිං වර්ගය හඳුන්වන නම කුමක් ද?

(1) පොලිපින් පැඩිං (2) කෘතිම පැඩිං (3) නයිලෝන් පැඩිං (4) කපු පැඩිං

37. ටෙඩි බෙයාර් නිර්මාණයේදී වැදගත්ම කරුණක් වන්නේ,

(1) අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමයි. (2) කැමති සතෙකුගේ අනුරුවක් තෝරා ගැනීමයි.
(3) පතරොම සකස් කිරීමයි. (4) රෙදි කපා ගැනීමයි.

38. කඩදාසි භාවිතයෙන් අලංකාර මල් සාදාගත හැකිය. ඕනෑම මලක් සාදා ගැනීමේදී විශේෂයෙන් සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ,

(1) මලේ පෙතිවල ප්‍රමාණය ගැන සිතීම.
(2) වර්ණ ගැලපීම.
(3) කල් පවත්නා ක්‍රම භාවිතය.
(4) මලේ ස්වාභාවික පෙනුමට සමාන ආකාරයෙන් නිර්මාණය කිරීම.

39. මිනිස් රූපයක් හෝ සත්ව රූපයක් ඇඹීමේදී නිවැරදි අවබෝධයක් ලබා ගත යුත්තේ කිනම් කරුණක් පිළිබඳව ද?

(1) මිනිස් හා සත්ව සිරුරේ පරිමාණයන් පිළිබඳව
(2) මිනිස් හා සත්ව හැසිරීම් පිළිබඳව
(3) වර්ණයන් පිළිබඳව
(4) හැඩය පිළිබඳව

40. මූර්ති නිර්මාණය සඳහා ප්ලාස්ටර් ඔෆ් පැරිස් භාවිත කරයි. ප්ලාස්ටර් ඔෆ් පැරිස් ඝන වීමට ප්‍රමාද නම් එය ඉක්මනින් ඝන වීමට යොදා ගන්නා ද්‍රව්‍යයකි,

(1) ජලය (2) ලුණු (3) හුණු (4) වැලි

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **84 - ශිල්ප කලා - II (නව නිර්දේශය)** **කාලය පැය 2 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) ග්‍රාමීය කර්මාන්ත හා වෙළඳ ප්‍රදර්ශනය පසුගියදා ජනකලා කේන්ද්‍රයේ දී පැවැත්විය. මේ සඳහා දේශීය වශයෙන් නිපදවන ලද අත්කම් භාණ්ඩ ප්‍රදර්ශනයට හා අලෙවිය සඳහා තිබුණි.

i. දේශීය වශයෙන් පවතින ගෘහ ආශ්‍රිත කර්මාන්ත 04 ක් නම් කරන්න.

ii. අත්කම් නිෂ්පාදන සඳහා යොදා ගත් අමුද්‍රව්‍ය වර්ග කර උදාහරණ 02 බැගින් ලියන්න.

iii. ප්‍රදර්ශනයේ විසිතුරු මැටි භාණ්ඩ ද දක්නට ලැබුණි. මැටි ආශ්‍රිත නිර්මාණ 04 ක් නම් කරන්න.

iv. පන් හා තල් කොට ආශ්‍රිතව මෙන්ම කෘතීම කෙඳි භාවිතයෙන් ද අත් බෑග් නිපදවයි. කාන්තා අත්බෑගයක් වියා ගැනීමට සුදුසු රටාවක් ඇඳ නම් කරන්න.

v. ස්වාභාවික මෙන්ම කෘතීම මල් භාවිතයෙන් මල් සැකසුම් කුටියක්ද විය. එහි දක්නට ලැබුණු මල් සැකසුම් ක්‍රම 04 ක් නම් කර ඉන් 02 ක් ඇඳ දක්වන්න.

vi. අත් ලේන්සුවකට සුදුසු මෝස්තරයක් ඇඳ එය මසා ගැනීමට යොදා ගත හැකි මැහුම් ක්‍රම 04 ක් නම් කරන්න.

vii. කෘතීම මල් සෑදීම සඳහා යොදා ගන්නා මාධ්‍ය 04 ක් නම් කරන්න.

viii. ආභරණ සෑදිය හැකි මාධ්‍ය 04 ක් ලියන්න.

ix. ප්‍රදර්ශනයේ ඉදිරි වසර සඳහා නිල සංකේතයක් නිර්මාණය කිරීමට අවස්ථාවක් ලැබුණි නම් ඒ සඳහා සුදුසු ලාංඡනයක් ජ්‍යාමිතික හැඩතල යොදා ගෙන නිර්මාණය කරන්න.

x. ග්‍රාමීය කර්මාන්ත නගා සිටුවීම සඳහා ඔබට කළ හැකි යෝජනා 02 ක් ලියන්න.


(ලකුණු 2x10=20)

(02) යම් ඇසුරුමක් සඳහා සකස් කරන පතරොම එම භාණ්ඩයේ විකසනය වේ.

i. සිලින්ඩරාකාර හැඩයෙන් සාදා ගත හැකි නිර්මාණ 04 ක් ලියන්න. (ල.02)

ii. ඉහත ඔබ නම් කළ නිර්මාණයක් සාදා ගන්නා ආකාරය පිළිවෙලින් ලියන්න. (ල.04)

iii. පහත රූපයේ විකසනය නිර්මාණය කරන්න. (ල.04)



(03) රෙදි පිළි අලංකරනයේදී ඉතා වැදගත් වන්නේ වර්ණ භාවිතයයි.

i. අතීතයේ නූල් වර්ණ ගැන්වීමට භාවිත කළ පාරිසරික අමුද්‍රව්‍ය 04 ක් නම් කරන්න. (ල.02)

ii. රෙදි පිළි පෙර පිරියම් කිරීම යනු කුමක් ද නම් කර පෙර පිරියම් ක්‍රම 03 ක් නම් කරන්න. (ල.04)

iii. රෙදි පිළි අලංකරණ ක්‍රම 03 ක් නම් කර ඉන් එක් ක්‍රමයකට කුෂන් කවරයක් අලංකාර කර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල.04)

(04) හීරි වියමන් රටා භාවිත කරමින් මේස රෙද්දක් වියා ගැනීමට අවශ්‍ය විය.

හැදයේ දිග මීටර් 50

හැදයේ පළල සෙ.මී. 90 කි.

සෙ.මී. 1 ට ඇති දික් නූල් ගණන 30 කි.

දික් නූලේ අංකය $2/30^s$

දික් නූල් වශයෙන් තිල්පාට හා හරස් නූල් වශයෙන් කහ පාටද යොදා ගනී.

i. ස්වාභාවික ශාක කෙඳි ප්‍රභේදය නම් කරන්න. (ල.02)

ii. මේස රෙද්දක් වියා ගැනීමට සුදුසු හීරි වියමන් රටා දෙකක් නම් කර එයින් එක් වියමන් රටාවක් අඳින්න. (ල.04)

iii. මේස රෙද්ද වියා ගැනීම සඳහා වැයවන මුළු නූල් ප්‍රමාණය ගණනය කරන්න. (ල.04)

(05) අත් යන්ත්‍ර පේෂකර්මාන්තයේ දී රෙදි විවීද සඳහා පළමුවන කාර්ය වන්නේ නූල් ඔතා ගැනීමයි.

i. නූල් එතීම සඳහා භාවිත කරන උපකරණ කට්ටලය නම් කරන්න. (ල.02)

ii. ඉන් එක් උපකරණයක රූප සටහනක් අඳින්න. (ල.04)

iii. ජවනඩා යන්ත්‍රයේ කොටස් 03 ක් නම්කර කෙටියෙන් විස්තර කරන්න. (ල.04)

(06) වර්තමානයේ විලාසිතාවක් ලෙස මැටි භාණ්ඩ පරිහරණය සිදු කෙරේ. මැටි භාණ්ඩ අලංකාර කිරීම සඳහා ඉතා සරලවූ බොහෝ අලංකරණ ක්‍රම භාවිතයේ පවතී.

i. මැටි භාණ්ඩ පිළිස්සීමෙන් පසු අලංකරණ ක්‍රම හතරක් නම් කරන්න. (ල.02)

ii. එයින් එක් ක්‍රමයකින් මැටි භාණ්ඩයක් අලංකාර කර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල.04)

iii. මැටි භාණ්ඩ පිළිස්සීම සඳහා භාවිත කරන පෝරණු වර්ග 04 ක් නම් කර, එම පෝරණුවලට භාවිත කරනු ලබන ඉන්ධන වර්ග ලියන්න. (ල.04)

(07) වර්තමානයේ උද්‍යාන අලංකරණය කිරීමේ කලාව බොහෝ සේ ජනප්‍රියත්වයට පත්ව ඇත.

i. මූර්ති නිර්මාණය කිරීම සඳහා යොදා ගන්නා මාධ්‍ය 04 ක් නම් කරන්න. (ල.02)

ii. මූර්ති නිර්මාණය සඳහා යොදා ගන්නා ''ප්ලාස්ටර් ඔප් පැරිස්'' වල ලක්ෂණ 04 ක් ලියන්න. (ල.04)

iii. සිමෙන්ති මාධ්‍ය යොදාගෙන මිනිස් රූපයක් නිර්මාණ කර ගන්නා ආකාරය පියවර ලෙස විස්තර කරන්න. (ල.04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (2) | 02. (4) | 03. (3) | 04. (1) | 05. (3) | 06. (4) | 07. (2) | 08. (4) | 09. (3) | 10. (1) |
| 11. (4) | 12. (1) | 13. (1) | 14. (2) | 15. (1) | 16. (2) | 17. (4) | 18. (2) | 19. (4) | 20. (3) |
| 21. (3) | 22. (3) | 23. (2) | 24. (2) | 25. (1) | 26. (4) | 27. (4) | 28. (3) | 29. (4) | 30. (3) |
| 31. (1) | 32. (1) | 33. (2) | 34. (1) | 35. (2) | 36. (3) | 37. (3) | 38. (4) | 39. (1) | 40. (2) |

## II පත්‍රය

(01) i. පන් හා කෙඳි ආශ්‍රිත, කොහු හා කෙඳි, බීරළු කර්මාන්ත රෙදි පිළි ආශ්‍රිත කර්මාන්ත ආදිය

ii. ස්වාභාවික, කෘතීම පන්, කෙඳි, කොහු, ශාක කොටස් ආදිය

iii. මැටි ආශ්‍රිත නිර්මාණ නිවැරදි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iv. සුදුසු රටාවක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න.

v. මල් පොකුරු, මල් මාලා, මල් කලඹ, මල් කුඩ, මල් කිනිති ආදිය ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

vi. නැටි මැස්ම, දම්වැල් මැස්ම, බ්ලැන්කට් මැස්ම, ලේසිඩේසි මැස්ම ආදිය

vii. කඩදාසි, ඉටිරෙදි, රිබන්, පබළු, රෙදි වර්ග ආදිය

viii. කඩදාසි, පබළු, ක්ලේ, මැටි, කෝන් ප්ලවර් ආදිය

ix. සුදුසු නිර්මාණයකට ලකුණු ලබා දෙන්න.

x. සුදුසු යෝජනා දෙකක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 02 × 10 = 20)

(02) i. බෝනික්කා, මල් බඳුන්, කෝප්ප, අත් බෑග්, වතුර බෝතල් රඳවනය, පෑන් පැන්සල් රඳවනයක් ආදිය (ල.02)

ii. සුදුසු නිර්මාණයට ලකුණු ලබා දෙන්න. (ල.04)

iii. විකසනය ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

(03) i. මකුළු මැටි, සාදිලිංගම්, ගොකටු ගසේ කිරි, අඳුන් දූලි ආදිය (ල.02)

ii. පෙර පිරියම් කිරීම යනු නිෂ්පාදිත රෙදි වලට ස්වාභාවිකව හා බාහිරව එක්වූ අපද්‍රව්‍ය ඉවත් කිරීමයි. / කැඳ හරණය, මළ හරණය / විරංජනය (ල.04)

iii. අතින් පින්තාරුව, ස්ටෙන්සිල් මුද්‍රණය, අච්චු මුද්‍රණය ආදිය එක් ක්‍රමයක් පිළිබඳව නිවැරදිව පියවර වශයෙන් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

(04) i. කපු, තණ, නියඳ, වැනිලා, සීසල් (ල.02)

ii. සුදුසු වියමන් රටා 02 ක් ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

iii. $\frac{50 \times 90 \times 30 \times 2}{1000 \times 30} = 9\text{kg}$ (ල.04)

(05) i. එතුම් රෝදය, මල් චක්‍රය, දික්නූල් කූර, හැඩ නූල් කූර (ල.02)

ii. නිවැරදි රූප සටහන ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

iii. යන්ත්‍ර රාමුව, අලුව, පාපොලු, ලීවර ආදිය නම් කර විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

(06) i. සායම් ආලේපනය, විවිධ මාධ්‍ය භාවිතය, දිස්න යෙදීම ආදිය (ල.02)

ii. ක්‍රම දෙකක් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

iii. දේශීය පෝරණුව දර, දහයියා, ලී කුඩු / උඩු දහර පෝරණුව විදුලිය, ගෑස් / යටි දහර පෝරණුව විදුලිය, ගෑස් / පැති දහර පෝරණුව විදුලිය, ගෑස් (ල.04)

(07) i. ප්ලාස්ටර් ඔප් පැරිස්, සිමෙන්ති, පල්ප, මැටි, ගල් ආදිය (ල.02)

ii. (1) සුදු පැහැයෙන් යුක්තයි. ජලයට දැමූ විට රත් වීම. (2) ඉක්මනින් ඝන ඝනභාවයට පත්වේ, ජිප්සම් නැමති හුණුගල් වලින් සාදා ඇත. (ල.04)

iii. පියවර වශයෙන් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)